C
372
PAT

# දෙමාපියන් විදේශගතව ඇති දරුවන්ගේ සමාජීය වර්ධනයේ පවතින ආතතීන් පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයකි.

එස්. එම්. පතිරණ
(බී. ඒ. ; අධ්‍යාපන ඩිප්. (සම්මාන)

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන
පීඨයේ අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය
සම්බන්ධ අවශ්‍යතා අර්ධ වශයෙන්
පූරණය කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන
පර්යේෂණාත්මක නිබන්ධනයකි.

1987

නිබන්ධන උපදේශක:

ආචාර්ය එම්. යූ. සේදර
අධ්‍යාපන අංශය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

409929

## සා රා ං ශ ය

විදේශගතවූ දෙමාපියන් ඇති දරුවන් හා දෙමාපියන් අයත් වන සමාජ ආර්ථික මට්ටම, විදේශගත වූයේ මවද, පියාද නැතිනම් දෙදෙනාම්ද, මාපියන් විදේශගත්වීමෙන් පසු ළමුන් වාසය කළේ කා සමඟද හා විදේශගතවූ පියවරුන්ගේ හා මවුවරුන්ගේ අධ්‍යාපන මට්ටම් යන සාධක සමඟ විදේශගතවූ මව්පියන් සහිත ළමුන්ගේ සමාජ සංවර්ධනය කොතෙක් දුරට[illegible]පෙන්නේද යන්න අනාවරණය කර ගැනීම, පර්යේෂණාත්මක අධ්‍යයනයකට ලක් කෙරිනි.

පර්යේෂණ සඳහා මහනුවර නගරයේ පාසල් අතුරින් ස්වර්ණමාලි බාලිකා මහා විද්‍යාලය, හේමමාලි බාලිකා මහා විද්‍යාලය, විද්‍යාර්ථ මහා විද්‍යාලය, කිංස්වුඩ් මහා විද්‍යාලයය යොදාගත, වයස අවුරුදු 11–16 දක්වා වයස් කාණ්ඩයන් හරහා, විදේශගතවූ දෙමාපියන් ඇති ගැහැණු හා පිරිමි ළමුන් 100 දෙනෙකුගෙන් යුක්ත නියැදියක් යොදා ගනිමින් දත්ත රැස් කෙරිනි.

සමාජ සංවර්ධන පරිමාණකයේ සමාජ සංවර්ධන සංරචක දොළහ හා මුලු පරීක්ෂණය විදේශගතවූ දෙමාපියන් සහිත ළමුන්ගේ සමාජ ආර්ථික තත්ත්වය, විදේශගතවූයේ කවුද, නැවති සිටිනුයේ කා සමඟද හා දෙමාපිය.. අධ්‍යාපන මට්ටම් හා එක් එක් සමාජ සංවර්ධන සංරචක අතර පවතින ස්වායත්ත බව හෝ පරායත්ත බව කයිවර්ග පරීක්ෂාව මගින් විභාග කොට වාර්තා කෙරින.

මෙම පර්යේෂණ පහත සඳහන් අනාවරණයන් වාර්තා කරයි.

1. මාපියන් විදේශගතවූ ළමුන්ගේ සමාජ සංරචක පොදු ලෙස බලන විට 10%කට වැඩි ප්‍රතිශතකයකට එවැනි දරුවන් සමාජ සංවර්ධනයේ දුර්වලතම් පෙන්වන සංරචක 3ක් දැකිය හැකිය. ආක්‍රමණශිලි බව, සංතර බව, හා ආත්ම කේන්ද්‍රිය බවයි.

2. සමාජ මිටි පරීක්ෂණ අනුව සමාජ තේරීම අතින් පංතියේ කිසිම අයෙකු-ගේ තේරීමට ලක් නොවන ළමුන් ගණන පාසලේ සාමාන්‍ය සිසුන් අතර සිටින ප්‍රතිශතයකට වඩා වැඩි ප්‍රතිශතයක් විදේශගතවූ දෙමාපියන් ඇති ළමුන් අතර සිටී.

3. ගුරුභවතුන්ගේ දත්ත අනුව විදේශගතවූ දෙමාපියන් සහිත ගැහැණු ළමයින්ගේ කථා බහ කිරීම් හා උද්යෝගිමත් බව පිළිබඳව සමාජමය ගැටලු බහුලය. හැසිරීම් පිළිබඳව එතරම් ගැටලුවක් නැත. ඊට වඩා ගැටලු පිරිමි ළමුන් පෙන්වයි. හැසිරීම පිළිබඳව පිරිමි ළමුන්ගේ පාසල් දෙකෙහිම සතුටුදායක මට්ටමේදී 54.54% ක හා 24.24% ක ප්‍රතිශත -යක දුර්වලතා හැසිරීම් පෙන්වයි.

4. සමාජ ආර්ථික මට්ටම හා ළමුන්ගේ සමාජ සංවර්ධනය අතර විශේෂ අන්තර් යැපුමක් දක්නට නැත.

5. විදේශගතවූයේ මවද, පියාද, දෙදෙනාමද යන කරුණ හා ළමුන්ගේ සමාජ සංවර්ධනය අතර විශේෂ අන්තර් යැපුමක් ඇත.

6. දෙමව්පියන් විදේශගතවී සිටියදී ළමයා නැවති සිටිනුයේ කවුරුන් සමඟද යන කරුණ හා ළමුන්ගේ සමාජ සංවර්ධනය අතර විශේෂ අන්තර් යැපුමක් පෙන්වන්නේ නැත.

7. පියාගේ අධ්‍යාපන මට්ටම හා ළමුන්ගේ සමාජ සංවර්ධන අතරත්; මවගේ අධ්‍යාපන මට්ටම හා ළමුන් ගේ සමාජ සංවර්ධනය අතරත්; අන්තර් යැපුමක් පෙන්වයි.